# 10. ගෙවුම් ශේෂ ලේඛනය

ගෙවුම් ශේෂ ලේඛනය යනු වර්ෂයෙක කාලපරිච්ඡේදයක් තුළ රටක් විසින් සෙසු ලෝකය සමඟ කරන ලද ආර්ථික ගනුදෙනු හේතුවෙන් වෙනත් රටවලින් ලැබෙන විදේශ මුදල් හා විදේශ රටවලට ගෙවන විදේශ මුදල් හා ඒවා අතර වෙනස තුලනය කරන ආකාරය දක්වන ලේඛනයයි

- එමගින් කිසියම් රටක නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදු වන සියලු ම ආර්ථික ගනුදෙනු ක්‍රමානුකූලව ද්විත්ව සටහන් මූලධර්මය මත සටහන් කෙරේ
- ගෙවුම් තුලන ලේඛණයක ඇතුලත් කරන ගනුදෙනු වාර්තා කිරීමේ දී අනුගමනය කරන මූලික සම්මතය වනුයේ සෑම ගනුදෙනුවක් ම එක හා සමාන වටිනාකමින් දෙතැනක සටහන් කළ යුතු වීමයි
- මෙම ගනුදෙනු සටහන් කිරීමේදී සෑම ගනුදෙනුවක ම වටිනාකම හර අගයක් සහ බැර අගයක් වශයෙන් තීරු දෙකක සටහන් කළ යුතු අතර බැර වටිනාකම (+) ලකුණෙන් සහ හර වටිනාකම (-) ලකුණු සටහන් කළ යුතු වේ
- මෙලෙස ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් සියලුම ගනුදෙනු සමාන අගයකින් බැර තීරුවක සහ හර තීරුවක සටහන් කළ විට සියළුම ගණුදෙනු වල ශුද්ධ ශේෂය ශූන්‍ය අගයක් ගනී. ලේඛනය සෑමවිටම තුලනය වේ යනුවෙන් අදහස් වන්නේ මෙයයි
- ගෙවුම් තුලන ලේඛනයේ හර සහ බැර අගයන් වෙන් වෙන්ව සටහන් කිරීමේදී මූලධර්ම දෙකක් අනුගමනය කළ යුතුය

✓ භාණ්ඩයක්, සේවාවක්, වත්කමක් තම රටෙන් වෙනත් රටකට බැහැර වන විට එම අයිතමයේ වටිනාකම බැර වටිනාකමක් ලෙස සටහන් කළ යුතු වෙයි.

- නිදසුන්: ශ්‍රී ලංකාවේ ඇඟලුම් අපනයනය කළ විට එම වටිනාකම ජංගම ගිණුමේ බැර සටහනක් ලෙස ඇතුළත් කළ යුතු වේ

✓ භාණ්ඩයක් සේවාවක් වත්කමක් තම රටට වෙනත් රටකින් ලැබෙන විට එම අයිතමයේ වටිනාකම හර වටිනාකමක් ලෙස සටහන් කළ යුතු වේ

- නිදසුන්: ශ්‍රී ලංකාවට මැදපෙරදිග රටකින් ඛනිජ තෙල් ආනයනය කළ විට එම වටිනාකම ජංගම ගිණුමේ හර සටහනක් ලෙස ඇතුළත් කළ යුතු වේ

- **ගෙවුම් තුලන ලේඛනයක ඇතුලත් කරන ගනුදෙනු පස් වැදෑරුම් වේ**

1) භාණ්ඩ සහ සේවා අපනයනය කිරීම සහ ආනයනය කිරීමට අදාළ ගනුදෙනු
2) ආදායම් ලැබීම හා ගෙවීම ආශ්‍රිත ගනුදෙනු
3) වත්කම්, ධනය, ත්‍යාග වැනි දෑ පිළිබඳව ඒකපාර්ශ්වීයව සිදුවන ගනුදෙනු
4) නිෂ්පාදනය නොකල මූල්‍ය නොවන වත්කම් හිමිකර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු
5) මූල්‍ය වත්කම් හිමිකර ගැනීම හා විකිණීම ආශ්‍රිත නුදෙනු

- **ගෙවුම් තුලන ලේඛනයේ නව ආකෘතියට අනුව ප්‍රධාන ගිණුම් තුනකි**
  - I. ජංගම ගිනුම
  - II. ප්‍රාග්ධන ගිණුම
  - III. මූල්‍ය ගිණුම

- **ජංගම ගිනුම නැවත ප්‍රධාන කොටස් තුනකි,ඒවා නම්**
  - භාණ්ඩ හා සේවා ගිණුම
    - භාණ්ඩ ගිණුම
    - සේවා ගිණුම
  - ප්‍රාථමික ආදායම් ගිණුම
  - ද්විතීක ආදායම් ගිණුම

# I. ජංගම ගිණුම / වර්තන ගිණුම

ජංගම ගිණුම යනු කිසියම් කාල පරිච්ඡේදයක් තුළ රටක නේවාසිකයන් සහ අනේවාසිකයින් අතර සිදු වන භාණ්ඩ හා සේවා, ප්‍රාථමික ආදායම් හා ද්විතීක ආදායම් යන ප්‍රවාහයන් ඇතුළත්වන ගිණුම ය

මෙය උප ප්‍රධාන ගිණුම් තුනකින් සමන්විත වේ

1. භාණ්ඩ හා සේවා ගිණුම
2. ප්‍රාථමික ආදායම් ගිණුම
3. ද්විතීයික ආදායම් ගිණුම

## 1. භාණ්ඩ හා සේවා ගිණුම

භාණ්ඩ හා සේවා නිෂ්පාදන ක්‍රියාවල ප්‍රතිඵලයක් ලෙස නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදු වන භාණ්ඩ හා සේවා ආනයන අපනයන ඇතුළත් වන ගිණුමයි

මෙහි උප ගිණුම් දෙකක් ඇත

### 1) භාණ්ඩ ගිණුම / වෙළඳ ගිණුම

ලෝකයේ එක් රටක් සෙසු රටවල් සමග සිදු කරන භාණ්ඩ අපනයන හා ආනයනය පිළිබඳව පිළිබඳව සටහන් කරන ගිණුම භාණ්ඩ ගිණුම හෙවත් වෙළෙඳ ගිණුම ලෙස හැඳින්වේ .

මෙම වෙළෙඳ ගිණුමේ මූල්‍ය නොවන රත්‍රන් පෞද්ගලික අංශයේ වටිනාකම් සන්නිධියක් ලෙස ලෙස සඳහන් වේ

මෙම වෙළෙඳ ගිණුමේ ශේෂය වෙළඳ ශේෂය ලෙස හඳුන්වයි. දෘශ්‍ය භාණ්ඩ ගිණුමේ ශේෂය ලෙස ද එය හඳුන්වයි.

**වෙළෙඳ ගිණුමේ සටහන් කරන ගනුදෙනු**

- **විදේශීය භාණ්ඩ අපනයනය හා ආනයනය**
- **සැකසීම සඳහා ගෙනෙන භාණ්ඩ ප්‍රති අපනයනය**
- **මූල්‍ය නොවන රන්**

**වෙළෙඳ ශේෂය = භාණ්ඩ අපනයනය - භාණ්ඩ ආනයනය**

**නිදසුන් :**

1) ශ්‍රී ලංකාවේ ඇඟලුම් සමාගමක් මිලියන 500 ක් වටිනා ඇඟලුම් තොගයක් අපනයනය කිරීම
2) ජපානයේ මෝටර් රථ සමාගමකින් මිලියන දාහක් වටිනා මෝටර් රථ ආනයනය කිරීම

මෙම නිදසුන සම්බන්ධ කරුණු අනුව භාණ්ඩ ගිණුමට ඇතුලත් වේ

වෙළෙඳ ශේෂය = භාණ්ඩ අපනයනය - භාණ්ඩ ආනයනය

- 500 = (ඇඟලුම් අපනයනය) 500 - (ඇඟලුම් ආනයනය) 1000

වෙළෙඳ ගිණුමේ ශේෂය අතිරික්තයක් හෝ හිඟයක් හෝ විය හැකියි
ඉහත නිදසුන අනුව වෙළඳ වෙළෙඳ ගිණුමේ ශේෂය සෘණ අගයකි

## 2) සේවා ගිණුම

අන්තර්ජාතික වෙළඳාමේ දී රටත් අනෙකුත් රටවල් සමඟ සාධක නොවන සේවා සඳහා කරනු ලබන වියදම් සහ ලැබෙන ආදායම් සටහන් කරන ගිණුම සේවා ගිණුම වෙයි

**සේවා ගිණුමට පහත සඳහන් සංරචක අයත් වේ**

- සංචාරක සේවා
- මුහුදු ප්‍රවාහන
- ගුවන් ප්‍රවාහනය
- මූල්‍ය සේවා
- විදුලි සංදේශ සේවා
- රක්ෂණ සේවා

**සේවා ගිණුමේ ශේෂය = සේවා අපනයන ආදායම - සේවා ආනයන වියදම**

- සේවා ගිණුමේ ශේෂය අතිරික්තයක් + හෝ හිඟයක් - විය හැකිය

භාණ්ඩ ගිනුමේ ගිනුමේ ශේෂය සේවා ගිණුමේ ශේෂය ගැළපීමෙන් භාණ්ඩ හා සේවා ගිනුමේ ශේෂයය ලැබේ

**භාණ්ඩ හා සේවා ගිනුමේ ශේෂය = භාණ්ඩ ගිණුමේ ශේෂය + සේවා ගිණුමේ ශේෂය**

## 2. ප්‍රාථමික ආදායම් ගිණුම

ප්‍රාථමික ආදායම ගිණුමට ඇතුළත් වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රයෙන් පැනනගින පොළී, වැටුප් හා මූල්‍ය වත්කම් ආයෝජනයෙන් උපයාගන්නා ලාභාංශ ආදියයි. සාරාංශ ලෙස නිෂ්පාදන සහ එම ගෙවීම් ආශිත ශේෂයන් ය

ප්‍රාථමික ආදායම් ගිණුමට ඇතුලත් කරන ගනුදෙනු

- සේවක වැටුප්
- ආයෝජන ආදායම්
- නිෂ්පාදනය මත අයකරනු ලබන බදු සහ සහනාධාර
- නිශ්පාදනය නොකළ මූල්‍යය නොවන ස්වභාවික සම්පත් බදු දීමෙන් උපයා ගනු ලබන බදු කුලී, පුරස්කාර, සන්නම්, ස්වාධිකාර, වරලත් බලපත්‍ර ආදියෙන් උපයා ගන්නා ආදායම්

**ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය = විදේශ සාධක ලැබීම් - විදේශ සාධක ගෙවීම්**

**නිදසුන් :**

1) ශ්‍රී ලංකාවේ විදේශීය රටවලින් ලබාගත් ලබා ගත් ණය සඳහා වාර්ෂික පොලිය මිලියන 500 ක් ගෙවීම
2) ශ්‍රී ලාංකික සමාගමක් මාලදිවයිනේ ඇගලුම් ඇගළුම් කම්හලක ආයෝජනයෙන් මිලියන 300 ක් ලාභාංශ ලැබීම

මෙම නිදසුන් සම්බන්ධ ගනුදෙනු ගෙවුම් තුලන ලේඛනයේ ප්‍රාථමික ආදායම් ගිණුමට ඇතුලත් වේ

ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය = විදේශ සාධක ලැබීම් - විදේශ සාධක ගෙවීම්

- 200 = 300 – 500

## 3. ද්විතීක ආදායම් ගිණුම

ද්විතීක ආදායම් ගිණුම යටතට ගැනෙන්නේ නේවාසිකයන් සහ අනේවාසිකයින් අතර සිදුවන රාජ්‍ය සහ පෞද්ගලික යන සියලුම ජංගම සංක්‍රාමයන්ය.

සංක්‍රාම ප්‍රධාන කොටස් දෙකකි

1. පෞද්ගලික සංක්‍රාම
2. නිල සංක්‍රාම

| |
|---|
| **ගිණුමේ ශේෂය = විදේශ සංක්‍රාම ලැබීම් - විදේශ සංක්‍රාම ගෙවීම්** |

**නිදසුන් :**

1) මැදපෙරදිග සේවය කරන ශ්‍රී ලාංකිකයන් තම ඥාතීන්ට මිලියන 1500 ක ප්‍රේෂණ වශයෙන් වානිජ බැංකුව වෙත එවීම
2) ශ්‍රී ලංකාවේ චීන ජාතිකයන් තම ඥාතීන් වෙත මිලියන 500ක ප්‍රේෂණ චීනයේ බැංකුවක් වෙත යැවීම

ගිණුමේ ශේෂය = විදේශ සංක්‍රාම ලැබීම - විදේශ සංක්‍රාම ගෙවීම්

1000 = 1500 - 500

ගෙවුම් තුලන ලේඛනයෙහි ජංගම ගිණුමට ඇතුලත් භාණ්ඩ හා සේවා ගිනුමේ ශේෂය, ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය, ද්විතීක ආදායම් ගිණුමේ ශේෂය, ගැලපීමෙන් ජංගම ගිණුමේ ශේෂය ලැබේ

| | |
|---|---|
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය | xxx |
| ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | xxx |
| ද්විතීක ආදායම් ගිණුමේ ශේෂය | xxx |
| ජංගම ගිණුමේ ශේෂය | xxx |

| | හර | බැර | ශේෂය |
|---|---|---|---|
| භාණ්ඩ හා සේවා ගිනුමේ ශේෂය | 500 | 1000 | -500 |
| ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | 300 | 500 | -200 |
| ද්විතීක ආදායම් ගිණුමේ ශේෂය | 1500 | 500 | 500 |
| **ජංගම ගිණුමේ ශේෂය** | | | **-200** |

**ජංගම ගිණුමේ හිඟය අඩු කර ගැනීමට යෝජනා**

- අපනයන පුළුල් කිරීම
- විදේශ සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම
- අපනයන විවිධාංගීකරණය
- විදේශ ණය කළමනාකරණය කිරීමෙන් පොලී ගෙවීම් අඩුකර ගැනීම
- ආනයන ආදේශන ප්‍රතිපත්ති

# II. ප්‍රාග්ධන ගිනුම

නිෂ්පාදනය නොක මූල්‍ය නොවන වත්කම් ආශ්‍රිතව නේවාසිකයන් සහ අනේවාසිකයින් අතර සිදුවන ගනුදෙනු ප්‍රාග්ධන ගිණුමේ හර බැර ලෙස සටහන් වෙයි

(මූල්‍ය වත්කම් මූල්‍ය ගිණුම තුළ ඇතුළත් වන අතර නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් ප්‍රාග්ධන ගිණුමේ සටහන් කරනු ලැබේ)

### ➢ ප්‍රාග්ධන ගිණුමට ඇතුලත් කරන ගනුදෙනු

1) ප්‍රාග්ධන සංක්‍රාම
2) නිශ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම හා විකිණීම

නිෂ්පාදනය නොකළ නොකල මූල්‍ය  වත්කම් කිහිපයක් පහත දැක්වේ

- බලපත්‍ර
- බදු ගිවිසුම්
- සන්නම්
- කීර්තිනාමය විකිණීම් / මිලදී ගැනීම්
- තානාපති කාර්යාලයකට ඉඩම් විකිණීම
- ජාත්‍යන්තර ආයතන / රජයෙන් ලබාදෙන ප්‍රධාන
- පේටන්ට් බලපත්‍ර (ස්වාධිකාරී අයිතිය )
- පුරස්කාර

# III. මූල්‍ය ගිණුම

ගෙවුම් තුලන ලේඛයේ අවසාන උප ගිණුම මූල්‍ය ගිණුමයි

නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර සිදුවන මූල්‍ය වත්කම් හා වගකීම් ආශ්‍රිත ගනුදෙනු මූල්‍ය ගිණුමේ වාර්තා කෙරේ

කාර්යාත්මක ස්වරූපය මත මූල්‍ය ගිනුමේ ගනුදෙනු ප්‍රධාන වශයෙන් කොටස් පහකට බෙදිය හැකිය. ඒවා නම්,

1) සෘජු ආයෝජන
2) කළඹ ආයෝජන
3) මූල්‍ය ව්‍යුත්පන්න

4) වෙනත් ආයෝජන
5) විදේශ සංචිත වත්කම්
    - මූල්‍ය රන්
    - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ ගැනුම් හිමිකම්
    - සාමාජික රට සතු ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සංචිත පහසුකම්
    - විදේශ විනිමය ශේෂ
    - විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු

## ❖ ගෙවුම් තුලන අසමතුලිතතා

කිසියම් රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමේ සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂ වල එකතුව එම රට අවශේෂ ලෝකය සමග ශුද්ධ ණය හිමියෙක්ද (ගෙවුම් තුලන අතිරික්තයක්) නැතහොත් ශුද්ධ ණයගැතියයෙක්ද (ගෙවුම් තුලන හිඟයක්ද) යන්න පෙන්නුම් කරයි

ද්විත්ව සටහන් මූලධර්මය අනුව ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂ වල එකතුව මූල්‍ය ගිණුමේ ශේෂයට සමාන විය යුතු අතර, කිසියම් සංඛ්‍යානමය වරදක් නිසා අසමානතාවක් හටගත හොත් "ශුද්ධ වැරදියි හා අත්හැරීම්" යන අයිතමය යොදා ගනිමින් එම සමානත්වය ඇති කෙරේ.

ද්විත්ව සටහන් මූලධර්මය අනුව අවසානයේ හර සටහන් වල එකතුව බැර සටහන් වල එකතුවට සමාන වීමෙන් ගෙවුම් ශේෂය තුලනය වේ. නමුත් ගෙවුම් ශේෂයේ ජංගම ගිනුමේ සහ ප්‍රාග්ධන ගිණුමේ අන්තර්ගත ස්වායක්ත ගනුදෙනුවල සමස්ත ප්‍රතිඵලය සලකා බලා හිඟයක් හෝ අතිරික්තයක් පිළිබඳ විග්‍රහ කළ හැක

මූල්‍ය ගිණුම මගින් පෙන්වා දෙන්නේ රටක ශුද්ධ ණය හිමි බව හෝ ශුද්ධ ණය ගැති බව මූල්‍යකරණය කෙරෙන ආකාරය යි.

ගෙවුම් තුලන ලේඛනයේ ලේඛනයේ එක් එක් ගිණුම් වලට අයත් අයිතමයන් කල්පිත සංඛ්‍යාලේඛන ඇතුළත් කරපහත සටනෙන් පැහැදිලි කර ඇත.

| **අයිතමය** | **බැර** | **හර** |
|---|---|---|
| <u>වෙළඳ ගිනුම</u> | | |
| අපනයනය | 1000 | |
| ආනයනය | | 1300 |
| මූල්‍ය නොවන රතුන් ලැබීම | 150 | |

| | | |
|---|---|---|
| මූල්‍ය නොවන රත්‍රන් ගෙවීම | | 200 |
| සේවා ගිණුම | | |
| ලැබීම් | 800 | |
| ගෙවීම් | | 600 |
| **භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය** | | **(150)** |
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය | | |
| ලැබීම් | 800 | |
| ගෙවීම් | | 1000 |
| **ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය** | | **(200)** |
| ද්විතීක ආදායම් ගිණුම | | |
| සේවා නියුක්ති ප්‍රේෂණ ලැබීම | 1800 | |
| සේවා නියුක්ති ප්‍රේෂණ ගෙවීම | | 800 |
| රජයේ සංක්‍රාම ලැබීම | 400 | |
| **ද්විතීක ආදායම් ගිණුමේ ශේෂය** | **1400** | |
| **ජංගම ගිණුමේ ශේෂය** | **1050** | |

| **අයිතමය** | **බැර** | **හර** |
|---|---|---|
| ප්‍රාග්ධන ගිණුම | | |
| ප්‍රාග්ධන ගිණුම - ලැබීම් | 600 | |
| ප්‍රාග්ධන ගිණුම - ගෙවීම් | | 300 |
| **ප්‍රාග්ධන ගිණුමේ ශේෂය** | **300** | |
| **ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය** | **1350** | |
| මූල්‍ය ගිණුම | | |
| සෘජු ආයෝජන - වත්කම් | 150 | |
| සෘජු ආයෝජන - වගකීම් | | 100 |
| විවිධ ආයෝජන - වත්කම් | 200 | |
| විවිධ ආයෝජන - වගකීම් | | 150 |
| අනෙක් ආයෝජන වත්කම් | 150 | |
| අනෙක් ආයෝජන වගකීම් | | 50 |
| සංචිත වත්කම් (ශුද්ධ) | 250 | |
| **මූල්‍ය ගිණුමේ ශේෂය** | **450** | |

ඉහත කල්පිත ගෙවුම් තුලන ලේඛනයේ ජංගම හා ප්‍රාග්ධන ගිණුමේ ශේෂය රුපියල් මිලියන 1350 ක් වන අතර, මූල්‍ය ගිණුමේ ශේෂය රුපියල් මිලියන 450 ක් වේ. ද්විත්ව සටහන් මූලධර්මය අනුව ඉහත ශේෂ දෙක සමාන විය යුතුය. මේ නිසා ශුද්ධ වැරදීම් හා අත්හැරීම් රුපියල් මිලියන 900 ක් ලෙස ගෙන ඉහත ශේෂ දෙක සමාන කළ හැකිය.

## ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ අසමතුලිතතා හඳුනා ගනිමින් ඒ සඳහා විසඳුම් හා ක්‍රියාමාර්ග යෝජනා කිරීම.

| වර්ෂය | භාණ්ඩ සහ සේවා ගිනුමේ ශේෂය | ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | ද්විතීයික ආදායම් ගිණුමේ ශේෂය | ජංගම ගිණුමේ ශේෂය | ප්‍රාග්ධන ගිණුමේ ශේෂය | මූල්‍ය ගිණුමේ ශේෂය | සමස්ත ගිනුමේ ශේෂය |
|---|---|---|---|---|---|---|---|
| 2012 | -8155 | -1219 | 5392 | -3982 | 130 | 4263.4 | 151.2 |
| 2013 | -6429 | -1817 | 5639 | -2540.6 | 71 | 30637 | 958.4 |
| 2014 | -6407 | -1808 | 6227 | -1987.7 | 58.3 | -1536.1 | 1369 |
| 2015 | -6063 | -2013 | 6193 | -1882.8 | 46.3 | -2312.3 | -1488.7 |
| 2016 | -5994 | -2202 | 6453 | -1742.4 | 26 | -2181.8 | -500 |
| 2017 | -6317 | -2319 | 6326.6 | -2309 | 10.9 | -2122.8 | 2068.5 |
| 2018 | -6577 | -2385 | 6162.6 | -2799 | 14.4 | -3328.5 | -1102.9 |
| 2019 | -5148 | -2462 | 5766 | -1843 | 23 | | |
| 2020 | -5189 | -2101 | 6207 | -1083 | 28 | | |

- ශ්‍රී ලංකාවේ ජංගම ගිණුමේ ශේෂය දීර්ඝකාලීන හිඟයක් පවතී.
- භාණ්ඩ ගිණුමේ ශේෂය ද (වෙළඳ ශේෂය) දීර්ඝකාලීන හිඟයක් පෙන්නුම් කරන අතර සේවා ගිණුමේ අතිරික්තයක් පෙන්නුම් කරයි.
- භාණ්ඩ හා සේවා ගිනුමේ ශේෂයේ පවතින හිඟය පිළිබඳ දත්ත විශ්ලේෂණයක් පහත දැක්වෙන සංඛ්‍යා ලේඛන වගුවෙන් ඉදිරිපත් කෙරෙයි.

| වර්ෂය | භාණ්ඩ ගිනුමේ ශේෂය | සේවා ගිනුමේ ශේෂය | භාණ්ඩ සහ සේවා ගිනුමේ ශේෂය |
|---|---|---|---|
| 2012 | -9417 | 1262 | -8155 |
| 2013 | -7609 | 1180 | -6429 |

| | | | |
|---|---|---|---|
| 2014 | -8287 | 1880 | -6407 |
| 2015 | -8388 | 2325 | -6063 |
| 2016 | -8873 | 2879 | -5994 |
| 2017 | -9619 | 3303 | -6317 |
| 2018 | -10343 | 3766 | -6577 |
| 2019 | -7997 | 2849 | -5148 |
| 2020 | -6008 | 819 | -5189 |

- පළමු වගුව මගින් ප්‍රාථමික ආදායම් ගිණුමේ පවතින හිගය ඉහළ ඉහලයාම පෙන්නුම් කරන අතර එම හිගය ජංගම ගිණුමේ හිගය කෙරෙහි බලපා ඇත
- ද්විතීක ආදායම් ගිණුමේ ශුද්ධ ශේෂය අතිරික්තයක් පෙන්නුම් කරන අතර එය ක්‍රම ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරයි . එය ඉහළ යාම නිසා ජංගම ගිණුමේ හිගය අඩු වෙයි.
- ගෙවුම් තුලන ලලේඛනයේ ජංගම ගිණුමේ ශේෂය දීර්ඝකාලීන හිගයක් පෙන්නුම් කරයි 1977 වර්ෂයේ දී පමණක් ධන අගයක් ගෙන ඇති අතර ආර්ථිකය විවෘත වීමත් සමග දීර්ඝකාලීන හිගයක් පෙන්නුම් කරයි.
- ජංගම ගිණුමේ ශේෂය  ලබා ගන්නේ වෙළෙඳ ශේෂය, සේවා ශේෂය, ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය සහ ද්විතීක ආදායම් ගිණුමේ ශේෂය එකට ගැලපීමෙන්ය. ජංගම ගිණුමේ ශේෂය හිගය තීව්‍ර වීමට වෙළඳ ශේෂය සහ ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය සෘණ අගයක් ගැනීම හේතු වී ඇත.
- ගෙවුම් තුලන ලේඛනයේ අසමතුලිතතාව ලෙස හඳුන්වන්නේ සමස්ත ශේෂයේ හිගයක් හෝ අතිරික්තයක් හෝ පැවැතීමයි.
- කිසියම් රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිනුමේ සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂ වල එකතුව එම රට අවශේෂ ලෝකය සමග ශුද්ධ ණය හිමියෙක්ද නැතහොත් ශුද්ධ ණයගැතියෙක්ද යන්න පෙන්නුම් කරයි.
- ගෙවුම් ශේෂයේ සමස්ත ශේෂය අතිරික්තයකට වඩා හිගයක් පෙන්නුම් කරන විට ආර්ථික වශයෙන් ඉතා ප්‍රබල ප්‍රතිවිපාක ඇති කරයි. එම නිසා ගෙවුම් ශේෂයේ කෙටිකාලීන හිගය පියවීමට අවධානය යොමු කළ යුතු වේ .
- කෙටිකාලීනව හිගය පියවන්නේ කෙසේද යන්න කෙටිකාලීන මූල්‍යනය කිරීම ලෙස හඳුන්වයි .

**කෙටිකාලීන මූල්‍යනය කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ග කිහිපයක් පහත දැක්වේ.**

- විදේශ සංචිත යොදා ගැනීම
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් සමීපස්ථ  ණය ලබා ගැනීම
- වෙනත් ජාත්‍යන්තර මූල්‍ය ආයතන වලින් කෙටිකාලීන අරමුදල් ලබා ගැනීම

**දීර්ඝකාලීන හිගයක් පවතින විට ඒ සඳහා ඉදිරිපත් කළ හැකි විසඳුම් පහත දැක්වේ.**

- අපනයන විවිධාංගිකරණය
- සෘජු විදේශ ආයෝජන දිරිමත් කිරීම
- සාම්ප්‍රදායික අපනයන දිරිමත් කිරීම
- අපනයන ප්‍රවර්ධන කලාප පිහිටුවීම
- විදේශ රටවල් සමග ගිවිසුම්වලට එළඹීම
- විනිමය අනුපාතිකය ක්ෂය වීමට ඉඩ හැරීම හෝ අවප්‍රමාණය කිරීම
- දේශීය උද්ධමනය පාලනය කොට අපනයන වල තරගකාරීත්වය ඉහල නැංවීම
- ආනයන ආදේශන කර්මාන්ත වැඩිදියුණු කිරීම
- අත්‍යවශ්‍ය ආනයනය හැර අවශේෂ ආනයනය අධෛර්යයමත් කිරීම

## ➢ විදේශ සම්පත් පරතරය හා විදේශ වත්කම් වල ආනයන ශකයතාව වෙනස් වු ආකාරය

**විදේශ සම්පත් පරතරය**

නිශ්චිත කාලච්ඡේදයක් තුල ආර්ථිකයට ගලා එන සියලු විදේශ ලැබීම් හා ආර්ථිකයෙන් බැහැරව ගලා යන සියලු විදේශ ගෙවීම් අතර වෙනසයි.

### ❖ විදේශ ලැබීම්

1) අපනයන
2) සේවා ලැබීම්
3) ප්‍රාථමික ආදායම් ලැබීම්
4) ද්විතියික ආදායම් ලැබීම්

### ❖ විදේශ ගෙවීම්

1) ආනයන ගෙවීම්
2) සේවා ගෙවීම්
3) සාධක ආදායම් ගෙවීම්
4) ණය ආපසු ගෙවීම්
5) ආයෝජන ගලා යාම්
6) වාණිජ බැංකු වල ගෙවීම්
7) පෞද්ගලික ප්‍රග්ධන සංක්‍රාම ගෙවීම්

**විදේශ සම්පත් පරතරය = විදේශ ලැබීම් - විදේශ ගෙවීම්**

### ➢ විදේශ සම්පත් පරතරය ඍන අගයක් ගැනිමට හේතු

1) අපනයන වලට සාපේක්ෂ ආනයන වැඩි වීම.
2) ප්‍රාථමික ආදායම් ලැබීම් වලට සාපේක්ෂව ප්‍රාථමික ආදායම් ගෙවීම් වැඩි වීම.
3) ණය ආපසු ගෙවීම් වැඩි වීම.
4) වාණිජ බැංකු විදේශ රට වලට කරන ගෙවීම් ප්‍රමාණය වැඩි වීම.

### ➢ විදේශ සම්පත් පරතරයේ ඍණ අගයක් පැවතීම ආර්ථිකය මත ඇති කරන ප්‍රතිවිපාක

1) විදේශ වත්කම් ප්‍රමාණය අඩු වීම.
2) විදේශ ණය ගැනීම වැඩි වීම.
3) මුදලේ විදේශ අගය පහල යාම.
4) මුදල් සැපයුම අඩු වීම.
5) විදෙශ ණය සේවාකරණ ගෙවීම් ඉහල යාම.
6) ජාත්‍යන්තර ණය පාෂයකට අඩු වීම.

### ➢ විදේශ සම්පත් පරතරය පියවා ගන්නා ආකාරය.

1) කෙටි කාලින ණය ලබා ගැනීම.
2) ණය සැපයුම් කරුවන්ගෙන් ණය ගැනිම.
3) බැංකු ණය ලබා ගැනිම.
4) ජාත්‍යන්තර මූලය අරමුදලින් ණය ලබා ගැනිම.

ශ්‍රී ලංකාව පහළ ආදායම් ලබන රටවල් වර්ගීකරණයෙන් ඉහළ මැද ආදායම් ලබන රටක් ලෙස නම් කිරිමෙන් පසු ලංකාවට ලැබෙන සහන හා ප්‍රදාන සීමා වී ඇත. එම නිසා විදේශ ණය ලබා ගැනිමට සිදු වීමෙන් ණය පිරිවැය අධික වීමක් දක්නට ලැබේ.

## ❖ විදේශ වත්කම්

**විදේශ වත්කම් හිමිකාරිත්වය**

- මහ බැංකුව සතු විදේශ වත්කම්
- රජය සතු විදේශ වත්කම්

- තැම්පතු භාරගන්නා ආයතන සතු විදේශ වත්කම්

මහ බැංකුව හා රජය සතු විදේශ වත්කම් නිල විදේශ වත්කම් ලෙස හඳුන්වයි. මහ බැංකුව, රජය හා තැම්පතු භාරගන්නා ආයතන සතු විදේශ වත්කම් දළ මුළු විදේශ වත්කම් ලෙස හඳුන්වයි.

### ❖ විදේශ වත්කම් පැවතීමේ වැදගත්කම

1) මුදලේ විදේශ අගය ස්ථාවරව පවත්වා ගැනිමට හැකි වීම.
2) මුදල් සැපයුම තීරණය කිරිමට
3) ගෙවුම් ශේෂ හිගය පියවා ගැනිමට
4) විදේශ ආයෝජකයන්ගේ විශ්වාසය දිනා ගැනීමට
5) ආනයන ශක්‍යතාව පිරික්සීමට
6) මුල්‍ය අධිකාරියට විදේශ විනිමය වෙළඳපොලට බලපෑම් කිරිමේ හැකියාව තිරණය කිරිමට.

### ❖ විදේශ වත්කම් වල ආනයන ශක්‍යතාව

පවතින විදේශ වත්කම් වලින් කොපමණ මාස ගණනක් ඉදිරියට ආනයන හැකියාවක් තිබේද යන්න ආනයන ශක්‍යතාවයි.

$$\text{විදේශ වත්කම් වල ආනයන ශක්‍යතාව} = \frac{\text{විදේශ වත්කම් ප්‍රමාණය}}{\text{වාර්ෂික ආනයන වටිනාකම}} \times 12$$

## ➢ විදේශ ආයෝජන රටක ආර්ථිකයට බලපාන ආකාරය

විදේශ ආයෝජන යනු,

රටක් ආයතනයක් හෝ පුද්ගලයෙක් හෝ වෙනත් රටක මූල්‍ය වත්කම් මිලදී ගැනීම හෝ තම ව්‍යාපාර බිහි කිරීම සහ පවත්නා ව්‍යාපාර වල කොටස් වැඩි සංඛ්‍යාවක් මිලදී ගැනීම.

**විදේශ ආයෝජන වර්ගීකරණය**

I. සෘජු විදේශ ආයෝජන
II. කළඹ විදේශ ආයෝජන

### I. සෘජු විදේශ ආයෝජන

සෘජු විදේශ ආයෝජන යනු,

කිසියම් ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් විදේශීය රටක ඵලදායි මූර්ත වත්කම් අත්පත් කර ගැනීම.

උදාහරණ;

කර්මාන්තශාලා පතල් ඉඩකඩම් ආදී වත්කම් විදේශ ආයෝජකයන් අත්පත් කර ගැනීම

## මෑත කාලීන ප්‍රවනතා

- පසුගිය වසර කිහිපය තුළ විදේශීය සෘජු ආයෝජන බලාපොරොත්තු මට්ටමට අඩු වීම
- ආයෝජකයන්ගේ විශ්වාසය අඩුවීමට හේතුවක් ලෙස රට තුළ දේශපාලන ස්ථාවරයක් නොතිබීම නිසා ආයෝජන පහළ මට්ටමක පැවතීම
- මෑත වර්ෂවල අනුපාතිකය වැඩිවීමේ ස්වභාවයක් පෙන්නුම් කිරීම නිසා ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් නැගී එන ආර්ථිකයට දැඩි බලපෑමක් එල්ල වීම
- ආයෝජකයන්ගෙන් ඉගියෙන් වෙළඳපොල ආර්ථිකය තුළ ආයෝජනය කිරීමට මැලි වීම

## සෘජු ආයෝජනයේ හිතකර ප්‍රතිවිපාක

- විදේශ ආයෝජන තුළින් ශක්තිමත් වන ජාත්‍යන්තර සාධක සංචලතාව හේතුකොටගෙන සම්පත් බෙදීයාමේ කාර්යක්ෂමතාවය ඉහළ යාම
- අමතර ප්‍රාග්ධන ප්‍රවාහයන් රට තුළට ගලා ඒම තුළින් සම්පත් පරිහරණය (ඉතුරුම්-ආයෝජන)පියවා ගැනීමට හැකි වීම
- විදේශ විනිමය පරතරය පියවා ගැනීමට හැකිවීම (විදේශීය ලැබී විදේශීය ගෙවී අපනයන පරතරය)
- ගෙවුම් ශේෂ එයට පිළිතුරක් වීම
- ණය බර ඉහළ නොයාම
- නව තාක්ෂණය හා කළමනාකරණය රටට ලබා ගත හැකි වීම

## සෘජු ආයෝජනයේ අහිතකර ප්‍රතිවිපාක

- ලාභාංශ පොලී වශයෙන් විශාල මුදල් ප්‍රමාණයක් පිටරටට ඇදී යාම
- දේශීය ආර්ථික කටයුතු වලට අයහපත් බලපෑමක් ඇතිවීම
- ප්‍රාග්ධන සූක්ෂම නිෂ්පාදන ශිල්පීය ක්‍රම භාවිතය නිසා රැකියා අවස්ථා අහිමිවීම
- ස්වාභාවික සම්පත් අධි පරිභෝජනයට ලක්වීම දේශීය කර්මාන්ත අඩපණ වීම
- රජයට ලැබෙන බදු ආදායම නියම ලෙස නොලැබී යාම
- දේශීය ආයෝජකයන් සඳහා ඇති මුදල් විදේශ ව්‍යාපාර වෙත ඇදී යාම
- දේශීය ව්‍යාපාරවල දක්ෂ සේවකයන් විදේශ ව්‍යාපාර කරා යාම

## II. කළඹ ආයෝජන

කළඹ ආයෝජන යනු,

මූල්‍ය ප්‍රතිලාභයක් අපේක්ෂාවෙන් විදේශීය ආයෝජකයන් වෙනත් රටක ව්‍යාපාරික සමාගම් කොටස් පිළිනපත් ණයකර වාණිජ පත්‍රිකා ආදී මූල්‍ය වෙළඳපල උපකරණ මිලදී ගැනීම

කළඹ විදේශ ආයෝජන වල දී ආයෝජකයන්ට විදේශ ව්‍යාපාරයන්ගේ කළමනාකාරිත්වය, හිමිකම හෝ පාලනය පිළිබඳ හිමිකමක් නොලැබේ.

### මෑත කාලීන ප්‍රවනතා

- මෑත වර්ෂවල හිමිකම් කොටස් වෙත වූ විදේශීය ආයෝජන අඩුවීමක් පෙන්නුම් කිරීම
- රටේ පවතින දේශපාලන අස්ථාවරභාවය මත විදේශ අංශය කොටස් වෙළඳපලෙහි ආයෝජනය කිරීම මන්දගාමී ස්වරූපයක් දැක්වීම
- කොටස් වෙළඳපළ අස්ථාවරත්වය දිගටම අඛණ්ඩව පැවතීම හේතුවෙන් ආයෝජකයන් ආයෝජනයට මැළිවීම පෙන්නුම් කිරීම
- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් විසින් ශ්‍රී ලංකාවේ ආයෝජන සිදු කරනු ලබන සීමා හා ක්ෂේත්‍ර පුළුල් කිරීම හරහා ජයේ ප්‍රතිපත්ති හා සමගාමීව ආන්ඩුවේ ආයෝජන ප්‍රතිපත්ති නැවත සමාලෝචනය කිරීම

## ❖ විදේශ විනිමය අනුපාතිකය තීරණය වන ආකාරය

### ➢ විදේශ විනිමය වෙළඳපොල

විදේශ විනිමය ඉල්ලුම්කරුවන් හා සැපයුම්කරුවන් විදේශ විනිමය හුවමාරු කරගන්නා විදේශ විනිමය අනුපාතිකයන් හා විදේශ විනිමය ප්‍රමාණයන් තීරණය කරගැනීමට සම්බන්ධ වන ආයතනික ව්‍යුහයන් විදේශ විනිමය වෙළඳපොල වේ.

### ➢ විදේශ විනිමය වෙළඳපොලෙහි ක්‍රියාකාරී පාර්ශවයන්

- වාණිජ බැංකු
- විදේශ විනිමය තැරැව්කරුවන්

- ව්‍යාපාරික ආයතන
- මහබැංකුව
- මහජනතාව
- ආණ්ඩුව

## ❖ විදේශ විනිමය අනුපාතිකය

දේශීය ව්‍යවහාර මුදල් ඒකකයක් විදේශ ව්‍යවහාර මුදල් ඒකක බවටත් විදේශ ව්‍යවහාර මුදල් ඒකකයක් දේශීය ව්‍යවහාර මුදල් ඒකක බවටත් පරිවර්තනය කරන අනුපාතිකය විදේශ විනිමය අනුපාතිකය යි.

විදේශ විනිමය අනුපාතිකය ප්‍රකාශ කල හැකි ආකාර දෙකකි.

1) විදේශ ව්‍යවහාර මුදල් ඒකකයේ මිල දේශීය මුදලින් ප්‍රකාශ කිරීම. මෙය ඍජු කියවීම ලෙසද හඳුන්වයි.
2) දේශීය මුදල් ඒකකයක මිල විදේශීය මුදල් ඒකකයකින් ප්‍රකාශ කිරීම. මෙය වක්‍ර කියවීම ලෙස හඳුන්වයි.

### විනිමය අනුපාත වර්ග

I. ස්ථාවර විනිමය අනුපාතය
II. පාවෙන විනිමය අනුපාතය
III. පාලිත නම්‍ය විනිමය අනුපාතය

### I. ස්ථාවර විනිමය අනුපාතය

කිසියම් රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකකයක් සමග හුවමාරු වන අනුපාතය මූල්‍ය අධිකාරිය විසින් තීරණය කොට නැවත වෙනස් කරන තුරු නොවෙනස්ව තබා ගන්නා විනිමය අනුපාතයයි.

### ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයේ වාසි

- විනිමය සමපේක්ෂණ ක්‍රියා අතුරුදන්වීම.
- අපනයන හා ආනයන කරුවන්ට නිදහස් වෙළඳාමේ නිරත විය හැකිය.
- ණයගැති යන්ට හෝ හිමියන්ට අවාසියක් සිදු නොවීම .
- විනිමය අවදානමක් නොමැති නිසා ආයෝජන හා දිගුකාලීන ප්‍රාග්ධන ප්‍රවාහ ධෛර්යමත් වීම.
- විනිමය අනුපාතය වෙනස් නොවන නිසා උද්ධමනයට බලපෑමක් නැත.

### ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයේ අවාසි

- විනිමය සංචිත පවත්වා ගැනීමට සිදුවීම.
- විනිමය අනුපාතය අධි හෝ ඌණ තක්සේරු වීම.
- අයවැය හා මූල්‍ය ප්‍රතිපත්ති ස්වාධීනව ක්‍රියාත්මක කළ නොහැකි වීම.
- සංචිත ප්‍රමාණවත් නොවන විට දැඩි ආරක්ෂණවාදී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම.

### II. නම්‍ය (පාවෙන) විනිමය අනුපාතය

මූල්‍ය අධිකාරියේ කිසිදු මැදිහත් වීමක් නොමැතිව ඉල්ලුම් සැපයුම් බලවේග අනුව රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකකයක් සමග හුවමාරු වන අනුපාතය නිදහසේ තීරණය වීමේ ක්‍රමය නම්‍ය විනිමය අනුපාතය ලෙස හැඳින්වේ.

### නම්‍ය විනිමය අනුපාත ක්‍රමයේ වාසි

- සංචිත පවත්වා ගැනීම අවශ්‍ය නොවන බැවින් ඒවා ඵලදායි කටයුතු වලද විය හැකිය.
- විනිමය අනුපාතය අධි හෝ ඌණ තක්සේරු නොවීම.
- අයවැය හා මූල්‍ය ප්‍රතිපත්තිය ස්වාධීනව ක්‍රියාත්මක කළ හැකි වීම.
- ගෝලීය සම්පත් කාර්යක්ෂමව බෙදී යාම.

### නම්‍ය විනිමය අනුපාත ක්‍රමයේ අවාසි

- විනිමය සමපේක්ෂණ ක්‍රියා වැඩි වීම.
- විනිමය අනුපාතිකය නිතර වෙනස් වන නිසා අපනයන හා ආනයන කරුවන් ට අහිතකර ලෙස බලපෑම.
- ණය හිමියන්ට හා ණයගැතියන් ට අහිතකර ලෙස බලපෑම.
- විනිමය අනුපාතය නිතර වෙනස් වන විට බාහිර අස්ථායී තාවයක් ඇති වන නිසා ආයෝජන හා දිගුකාලීන ප්‍රාග්ධන ප්‍රවාහයන් අධෛර්යමත් වීම .
- විනිමය අනුපාතය වැඩි වුවහොත් දේශීය ආර්ථිකයේ උද්ධමනයක් ඇති වීම.

### III. පාලිත නම්‍ය විනිමය අනුපාතය

- පාවෙන විනිමය අනුපාත ක්‍රමයකදී විනිමය අනුපාතයේ දෝලනයෙන් (ඉහළ යෑම පහළ යෑම ) වැළැක්වීම සඳහා හඳුන්වා දී ඇති විනිමය අනුපාතය පාලිත නම්‍ය විනිමය අනුපාතය ලෙස හැඳින්වේ.
- මෙහිදී ඉල්ලුම් සැපයුම් බලවේග අනුව විනිමය අනුපාතය තීරණය වීමට ඉඩ නොදී එහි දෝලනය පාලනය කිරීම සඳහා මූල්‍ය අධිකාරිය මැදිහත් වන බැවින් අපිරිසිදු පා වීමක් මත විදේශ මුදලේ දේශීය අගය හෝ දේශීය මුදලේ විදේශ අගය තීරණය වේ.
- මෙවැනි විනිමය අනුපාතයකින් අපේක්ෂා කරන්නේ කෙටිකාලීන විනිමය අනුපාතිකය උච්චාවචනයන් වළක්වා දිගුකාලීනව විනිමය අනුපාතය නිදහසේ තීරණය වීමට ඉඩ හැරීමයි.
- පාවෙන හා ස්ථාවර යන විනිමය අනුපාත දෙකෙහිම වාසි හා අවාසි මෙහි පවතී.

### ❖ ක්‍රයශක්ති සාම්‍ය විනිමය අනුපාතිකය

සාමාන්‍ය භාණ්ඩ පැසක් රටවල් දෙකක් තුළ මිලදී ගැනීම සඳහා අවශ්‍ය මුදල් ප්‍රමාණය සමාන කොට ප්‍රේ ශක්ති සාම්‍ය විනිමය අනුපාතය ගණනය කෙරේ .එනම් රටවල් දෙකක් අතර මිලදී ගැනීමේ හැකියාව සමාන කොට ගණනය කරන විනිමය අනුපාතයයි.

**උදාහරණය**

කිසියම් භාණ්ඩ රැසක් ශ්‍රී ලංකාව තුළ රුපියල් ((50)00) හා ඇමරිකාවේ ඩොලර් 50 මිලට ගත හැකි නම් ක්‍රයශක්ති සාම්‍ය විනිමය අනුපාතය පහත ආකාරයෙන් ගණනය කළ හැක.

Usd 50 = Lkr 5000

Usd 1 = Lkr 5000 / Usd 50

Usd 1 = Lkr 100 (ක්‍රය ශක්ති සාම්‍ය විනිමය අනුපාතය)

### ❖ විනිමය අනුපාතය ක්ෂය වීමේ ආර්ථික ප්‍රතිවිපාක

1) වෙලඳ ශේෂය යහපත් වේ. (X වැඩිවීම - Y අඩුවීම)

Usd 1 = Rs200

ක්ෂය වීම

Usd 1 =Rs220

2) ආනයනික භාණ්ඩ මිල ඉහළ යාමෙන් දේශීය ආර්ථිකයේ උද්ධමනයක් ඇති වීම.
3) විදේශ ණය වාරික හා පොලී ගෙවීම වැඩිවීම.
4) සංචාරක ඉපැයීම් ඉහළ යාම නිසා සේවා ගිණුමට හිතකර බලපෑමක් ඇතිවීම.
5) සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යාමෙන් ද්විතීක ආදායම් ගිණුම යහපත් වීම.

## ➢ විනිමය අනුපාතය අවප්‍රමාණය කිරීම

ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක දී මූල්‍ය අධිකාරිය විසින් විදේශ මුදලකට ගෙවන දේශීය මුදල් ප්‍රමාණය වැඩි කිරීම.

උදාහරණයක් ලෙස මූල්‍ය අධිකාරිය ඩොලර් එකක් සඳහා ගෙවන රුපියල් ප්‍රමාණය 200 සිට 220 දක්වා වැඩි කිරීම.

## ➢ විනිමය අනුපාතය ප්‍රතිප්‍රමාණය කිරීම

ස්ථාවර විනිමය අනුපාත ක්‍රමයක දී මූල්‍ය අධිකාරිය විසින් විදේශ මුදලකට ගෙවන දේශීය මුදලය ප්‍රමාණය අඩු කිරීම කිරීමත් දේ දේශීය මුදලකට ලැබෙන විදේශ මුදල ප්‍රමාණය වැඩි කිරීම.

උදාහරණයක් ලෙස මූල්‍ය අධිකාරිය ඩොලර් එකක් සඳහා ගෙවන රුපියල් ප්‍රමාණය 220 සිට 200 දක්වා අඩු කිරීම.

අව ප්‍රමාණ කිරීමක ප්‍රතිවිපාක ක්ෂය වීමේ ප්‍රතිවිපාක වලට සමාන වේ.

## ➢ විනිමය අනුපාතය අවප්‍රමාණය කිරීමට හේතු

- ගෙවුම් ශේෂ අර්බුද වලක්වා ගැනීමට.
- අපනයන තරගකාරීත්වයක් ඇති කිරීමට.
- විදේශ විනිමය සංචිත අරක්ෂා කර ගැනීමට.
- සේවා නියුක්ති ප්‍රේෂණ දිරිගැන්වීම.

## ➢ විනිමය අනුපාතය ක්ෂය වීමක සඵලතාවය තීරණය කරන සාධක

1. අපනයන සඳහා විදේශ වෙළෙඳපොළේ දී නම්‍ය ඉල්ලුමක් පැවතීම.

   **PED X> 1**

2. ආනයන සඳහා දේශීය වෙළඳපොලේ නම්‍ය ඉල්ලුමක් පැවතීම.

   **PED m > 1**

3. අපනයන සැපයුම නම්‍ය වීම.

   **PES > 1**

4. මාර්ශල් - ලර්නර් කොන්දේසි ඉටු වීම.

   උදාහරණය

   **PEDx + PEDm > 1**

   0.6 + 0.8 > 1

අපනයන ඉල්ලුම හා ආනයන ඉල්ලුම අනම්‍ය වුවත් එම දෙකෙහි යයි යයිද එකට වඩා වැඩි නම් එය ගෙවුම් ශේෂයට වාසිදායක බලපෑමක් ඇති කරයි.

5. විදේශ උද්ධමනයට වඩා දේශීය උද්ධමනය අඩු වීම.
6. එක් රටක් මුදල් අව ප්‍රමාණය කරන විට අනෙක් රටවල් මුදල් අව ප්‍රමාණය නොකළ යුතුය.

## ➢ නාමික සඵල විනිමය අනුපාතය

කිසියම් රටක ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන්ගේ හා තරගකරුවන්ගේ නාමික විනිමය අනුපාතයන් හි බර තබන ලද සාමාන්‍ය අගය නාමික සඵල විනිමය අනුපාතිකය ලෙස හඳුන්වයි.

මෙය ප්‍රධාන ක්‍රම දෙකකට ගණන් කරනු ලබයි.

**1) ප්‍රධාන මුදල් වර්ග පහකට පැස මත.**

- ඇමරිකා එක්සත් ජනපද ඩොලර්
- ස්ටර්ලිං පවුම්
- යූරෝ
- ජපන් යෙන්
- ඉන්දියානු රුපියල්

**2) ප්‍රධාන මුදල් වර්ග 24ක පැස මත.**

## ➢ මූර්ත සඵල විනිමය අනුපාතය

දේශීය ආර්ථිකයේ උද්ධමනයත් ප්‍රධාන වෙළඳ තරගකරුවන්ගේ හා හවුල්කරුවන්ගේ උද්ධමනයෙන් ගැලපුණු පසු ලැබෙන නාමික සඵල විනිමය අනුපාතය මූර්ත සඵල විනිමය අනුපාතය ලෙස හැඳින්වේ.

මෙය ප්‍රධාන ක්‍රම දෙකකට ගණනය කරයි.

I. ප්‍රධාන මුදල් වර්ග පහක පැස මත.

II. ප්‍රධාන මුදල් වර්ග 24ක පැස මත.

## ❖ විදේශ විනිමය අනුපාතය වෙනස් වීමට බලපාන සාධක

**1)** ජාත්‍යන්තර වෙළඳාම.

- අපනයනය වැඩිවනවිට ඩොලරයේ අගය පහළ යන අතර රුපියලේ අගය ඉහළ යයි.
- ආනයනය වැඩිවනවිට ඩොලරයේ අගය ඉහළ යන අතර රුපියලේ අගය පහළ යයි.

**2)** ප්‍රාග්ධන සංචලන.

- විදේශ ආයෝජන ලැබීමේදී ඩොලර් ඒ අගය පහළ ගොස් රුපියල් අගය ඉහළ යයි.
- විදේශ ආයෝජන ගෙවීමේදී ඩොලරයේ අගය ඉහළ  ගොස් රුපියලේ අගය පහළ යයි.

**3)** මිල විචලනය.

- ශ්‍රී ලංකාවේ උද්ධමනය 10%
- ඉන්දියාවේ උද්ධමනය   6%
- මෙහිදී ඉන්දියාවෙන් භාණ්ඩ මිලදී ගන්නා විට ඉන්දියානු රුපියල් අගය වැඩි වී ඉන්දියානු රුපියල් මිල ඉහළ යයි එමගින් දේශීය රුපියලේ අගය පහළ යයි.

**4)** සමපේක්ෂණය.

- ඇමරිකානු එක්සත් ජනපද ඩොලරයක් මිලදී ගැනීම ලාබයි නම්.ඇමරිකානු එක්සත් ජනපද ජනපදය ඩොලරයක අගය ඉහළ යන අතර රුපියලේ අගය පහළ යයි.

**5)** ආර්ථික ශක්තිය.

- ආර්ථික ශක්තිය වැඩිවන විටදී රුපියලේ අගය ඉහළ යනවිට අතර ආර්ථික ශක්තිය අවම වන විට රුපියලේ අගය පහළ යයි.

**6)** රාජ්‍ය ප්‍රතිපත්ති.

- තීරු බදු ප්‍රතිපත්තියේ වැඩි වන විට ප්‍රතිපත්තිය වැඩිවන විටදී භාණ්ඩ ඉල්ලුම පහළ යෑම.මෙහිදී මෙහිදී ඇමරිකානු ඩොලරයක අගය පහළ යන අතර රුපියලේ අගය ඉහළ යයි.

**7)** කොටස් වෙළෙඳපොළ ගනුදෙනු.

- ශ්‍රී ලංකාව තුළ කොටස් වෙළෙඳපොළ ආයෝජනය කිරීම තුළින් ඇමරිකානු ඩොලරයක අගය පහළ යන අතර රුපියලේ මිල ඉහළ යයි.

**8)** දේශපාලන තත්වය.

- දේශපාලන ස්ථාවර තත්ත්වයක දී රුපියල් අගය ඉහළ යන අතර ඇමරිකානු ඩොලරයක අගය පහළ යයි.
- දේශපාලන අස්ථාවර තත්ත්වයකදී රුපියලේ අගය පහළ යන අතර ඇමෙරිකානු ඩොලරයක මිල ඉහළ යයි.

## ❖ බහු පාර්ශවීය මූල්‍ය ආයතන

බහු පාර්ශවීය මූල්‍ය ආයතන යනු,

ජාත්‍යන්තර මූල්ය සහයෝගීතාව ශක්තිමත් කොට ලෝක වෙළඳාම වර්ධනය කිරීමත් විනිමය අනුපාතිකයන්හී ක්‍රමවත් භාවයක් ඇති කිරීමත් අරමුණු කරගනිමින් ලෝකයේ රටවල් පිහිටුවාගෙන ඇති මූල්‍ය ආයතන

### ❖ බහු පාර්ශවීය මූල්‍ය ආයතන

I. අන්තර්ජාතික මූල්‍ය අරමුදල
II. ලෝක බැංකුව

## I. අන්තර්ජාතික මූල්‍ය අරමුදල IMF

- ආරම්භ කළ දිනය - 1945 දෙසැම්බර් 27
- ආරම්භක සාමාජිකයන් සංඛ්‍යාව 29
- වර්තමානය සාමාජිකයන් සංඛ්‍යාව186

ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවය, විනිමය අනුපාතිකය ස්ථාවරත්වය සහ විනිමය අනුපාතික ප්‍රබල විධිමත් භාවය ප්‍රවර්ධනය කිරීමත් ආර්ථික වෘද්ධිය හා සේවා නියුක්ති මට්ටම වර්ධනය කිරීමටත් ගෙවුම්ශේෂ ගැලපීම පහසු කරලීම සඳහා සාමාජික රටවලට තාවකාලික මූල්‍ය ආධාර සැපයීම පහසු කරලීම සඳහා සාමාජික රටවලට තාවකාලික මූල්‍යාධාර සැපයීම සඳහා ආරම්භ කර ඇත.

## ➢ අරමුණු

1. ජාත්‍යන්තර මූල්‍ය ගැටළුවලදී උපදේශන හා සහයෝගීතාවය ලබාදෙන ස්ථිර ආයතනයක් පිහිටුවීම මගින් මූල්‍ය සහයෝගීතාවය වර්ධනය කිරීම
2. සියලුම සාමාජික රටවල නිෂ්පාදන සම්පත් සංවර්ධනය කිරීමට ඉහළ සේවා නියුක්තිය හා මූර්ත ආදායම පවත්වාගෙන යාමටත් අන්තර්ජාතික වෙළෙඳාම සමබර වර්ධනයටත් වශ්‍ය පහසුකම් සැපයීම
3. සංවර්ධන රටවල් අතර විනිමය අනුපාතිකයන් ක්‍රමවත්ව පවත්වාගෙන යමින් විනිමය අනුපාතික යන්හි ස්ථාවර භාවයක් ඇති කිරීම
4. සමාජික රටවල නර්තන ගනුදෙනු සම්බන්ධයෙන් බව පාර්ශවය ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කිරීම හා අන්තර්ජාතික වෙළඳාමේ වර්ධනයට බාධා පමුණුවන විදේශ විනිමය සීමාවන් ඉවත් කිරීම
5. ගෙවුම් ශේෂය ගැලපුම ඇතිකර ගැනීම සඳහා අවශ්‍ය අරමුදල් සාමාජික රටවලට තාවකාලිකව ලබා දීම
6. සාමාජික රටවල ගෙවුම් ශේෂ අසමතුලිතතා හා එම අසමතුලිතතා පවතින කාලය අඩු කිරීම

## ➢ කාර්යයන්

1. ජාතික ආර්ථිකයන් හා ලෝක ආර්ථිකයන් අනතුරුදායක තත්ත්වයන් පත්වන අවස්ථා වල දී නිවැරදි මගට යොමු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම
2. බැංකු හා මූල්‍ය කටයුතු වල ගුණාත්මක භාවය ඇති කිරීම සඳහා අවශ්‍ය නීතිරීති පවත්වාගෙන යාමට උපදෙස් ලබාදීම
3. හදිසි මූල්‍ය අර්බුද වලදී සාමාජික රටවලට තාවකාලික පවතින පහසුකම් ලබාදීම දිගුකාලීන ආර්ථික ගැටලු වලදී මූල්‍ය පහසුකම් ලබා දීම හා ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කොට විසඳුම් ලබාදීමට අවශ්‍ය පියවර ගැනීම
4. සාමාජික රටවලට තාක්ෂණික සහයෝගීතාවය ලබාදීම හා රජයේ හා මහ බැංකු නිලධාරීන් පුහුණු කිරීම
5. සාමාජික රටවල් වතුර රාජ්‍ය මූල්‍ය විදේශ මූල්‍ය හා ජාතික ගිණුම වැනි අංශ සම්බන්ධ ප්‍රමිති සැකසීම හා ඒ අනුව තොරතුරු ප්‍රකාශයට පත් කිරීම මගින් අන්‍යෝන්‍ය අවබෝධය හා අධ්‍යාපනය සාමාජික රටවල් අතර බෙදා හැරීම

## II. ලෝක බැංකුව

- ආරම්භ කළ දිනය 1947 මාර්තු 1
- ආරම්භ වූ සාමාජික සංඛ්‍යාව 38
- වර්තමාන සාමාජිකයන් සංඛ්‍යාව 186

## ලෝක බැංකුවේ ප්‍රධාන ආයතන

- ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වන අන්තර් ජාතික බැංකුව
- අන්තර්ජාතික සංවර්ධන සංගමය

### අරමුණු

1. සාමාජික රටවල නිෂ්පාදන කටයුතු සඳහා පහසුකම් සැපයීම මගින් එම රටවල ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම
2. සාමාජික රටවලට ලිහිල් කොන්දේසි මත විදේශ ප්‍රාග්ධනය නොලැබෙන විට විදේශ පෞද්ගලික ආයෝජන දිරිගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් හා අවස්ථා ඇති කිරීම
3. පෞද්ගලික ආයෝජන වලට අමතරව බැංකුවේ අරමුදල් හා වෙනත් මාර්ග වලින් ලබා ගන්නා අරමුදල් ද භාවිත කරමින් සාමාජික රටවල ඵලදායි නිෂ්පාදන කටයුතු සඳහා දිගුකාලීන ණය සැපයීම
4. සාමාජික රටවල නිෂ්පාදන සම්පත් වර්ධනය කිරීම මගින් බව අන්තර්ජාතික ආයෝජන දිරිගැන්වීම මගින් අන්තර්ජාතික වෙළදාමේ සම්පර වර්ධනයක් ඇතිකිරීම
5. ලෝකයේ දිළිඳු බව අඩු කිරීම

### කාර්යයන්

1. සාමාජික රටවලට මූල්‍ය හා තාක්ෂණික ආධාර සැපයීම
2. සමාජික රටවලට සහනදායී කොන්දේසි යටතේ ණය ලබා දීම
3. විදේශ ආයෝජන ගෙන්වා ගැනීම සඳහා සාමාජික රටවලට අවශ්‍ය සහයෝගය ලබාදීම
4. සාමාජික රටවල සංවර්ධනය වේගවත් කිරීම සඳහා අවශ්‍ය ව්‍යාපෘති සැලසුම් කිරීමට අධීක්ෂණය කිරීමට ලෝක බැංකුව විශේෂඥයන්ගේ සහයෝගය ලබා දීම
5. තිරසාර සංවර්ධනය කිරීම සඳහා ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමටත් ආර්ථික ඵලදායීතා ඉහළ නැංවීමටත් පරිසරය ආරක්ෂා කිරීමට රජය හා පෞද්ගලික අංශ සහයෝගිතාවය ගොඩ නැංවීමට කටයුතු කිරීම
6. සාමාජික රටවලට ගෝලීයකරණ ගමන් මගට පිවිසීම සඳහා අවශ්‍ය සහයෝගය ලබා දීම
7. ලෝක වෙළෙඳ පොළේ මුන පෑමට සිදුවන අවාසිදායක තත්ත්වයන් සංවර්ධන ගැනීම සඳහා සාමාජික රටවලට අවශ්‍ය ආධාර සැපයීම
8. ලෝක ප්‍රජාව සමග යහපත් සම්බන්ධතා ගොඩනගා ගැනීම සඳහා සහයෝගය ලබාදීම
9. නව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජික රටවලට අවශ්‍ය සහයෝගය ලබා දීම